VIDUS 12-2-9

# වගා නිෂ්පාදනය සඳහා කෛන්ද්‍රීය පෝර

**ආනන්ද තෙන්නකෝන්**
**පොල් පර්යේෂණායතනය**
**ලුනුවිල.**

සංවර්ධනය වෙමින් පවතින රටවල මෑත අවුරුදු වල රසායන පෝර භාවිතය සැළකිය යුතු අන්දමින් වැඩි වී තිබේ. නිවර්තන රටවල් බොහොමයක වගා අස්වැන්න සැහෙන ප්‍රමාණයකින් වැඩි වී ඇති අතර රසායන පෝර ඉහළ අස්වනු ලබා දෙන බෝග වගාවේ ප්‍රධාන යෙදවුම් වර්ගය බවට පත් වී ඇත. සාමාන්‍ය වර්ගවලට අවශ්‍ය පෝෂකවලට වඩා උසස් මට්ටමක පෝෂක ඉහළ අස්වනු ලබා දෙන වර්ගවලට අවශ්‍ය වේ.

පාංශු පාලන පිළිවෙත් ගැන නොසලකා හැරියහොත්, මෙකී පෝෂණ අවශ්‍යතාවය අධික බෝගවලින් සිදු වන පෝෂක අවපූරණය සමගම, ගොවි කටයුතු, දැව සඳහා ගස් හෙළීම, පදුරු ලැහැබ් පිළිස්සීම හා අධික උලාකෑම නිසා සිදුවන වෘක්ෂලතා විනාශය හේතු කොට ගෙන පස නිසරු බවට පත්වනු ඇත.

ශාක වර්ධනය සඳහා පසෙහි පාංශු තත්ත්වය වැඩි දියුණු කිරීම කෛන්ද්‍රීය ද්‍රව්‍ය මගින් ඉටු වේ. කෛන්ද්‍රීය ද්‍රව්‍ය ලබා ගැනීමේ මාර්ග සෑම ගොවියෙකුටම ඇත. එනම් එළදවේ අපද්‍රව්‍ය බෝග, පිදුරු, එළවළු නැටි යනාදිය, නාගරික හෝ මුලුතැන්ගෙයි අපද්‍රව්‍ය, කැපූ අතු හා සත්ත්ව පෝර යනාදියයි. කෛන්ද්‍රීය පොහොර පාංශුවල භෞතික තත්ත්වය, පෝෂ්‍ය තත්ත්වය හා ජෛවීය ගුණාංග වැඩි දියුණු කරන හෙයින් නිතරම මෙකී පෝර භාවිතය සඳහා උත්සාහ කළ යුතුය.

යුරෝපයේ වර්ධනය කර ඇති නව ක්‍රමයක් නම් කැපූ කොළ අතුවලින් කොම්පෝස්ට් පිළියෙල කර එය පෝර වර්ගයක් ලෙස ප්‍රයෝජනයට ගැනීමයි. ගොවියාට අවශ්‍ය අමුද්‍රව්‍ය බහුල ලෙස ලබාගත හැකි වන ශ්‍රී ලංකාව වැනි රටවල මෙම ක්‍රමය ලාභදායී ලෙස උපයෝගී කර ගත හැකිය.

**කොළ අතුවලින් කොම්පෝස්ට් පිළියෙළ කර ගැනීම.**

කොළ අතුවලින් කොම්පෝස්ට් පිළියෙළ කර ගැනීමේ ක්‍රම දෙකක් ඇත.

**අතින් පිළියෙළ කර ගන්නා ක්‍රමය**

1. **අමුද්‍රව්‍ය**

(අ) අමුද්‍රව්‍ය විය යුත්තේ ශාක සුන්බුන්ය.

(ආ) විවිධ වර්ගයේ ශාක සුන්බුන් මිශ්‍ර කරනු ලැබේ.

(ඇ) යන්ත්‍රානුසාරයෙන් හෝ සාමාන්‍යයෙන් පිහියක් පාවිච්චි කරමින් ශාක ද්‍රව්‍ය කුඩා කැබලිවලට කපනු ලැබේ.

(ඈ) විශාලම කැබැල්ලේ අර්ධ විෂ්කම්භය මිලිමීටර 8 කට අඩු විය යුතුය.

(ඉ) ඛනිජ පෝර වර්ගයක් හෝ රසායනිකයක් (මිශ්‍රණයේ pH අගය පාලනය කිරීම සඳහා ඇතැම්විට එක් කරනු ලබන කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් හැරුණු විට) එක් කරනු නොලැබේ.

2. **ආර්ද්‍රකරණය**

මෙම ද්‍රව්‍ය යටත් පිරිසෙයින් පැය 24 කට ජලයේ පෙඟවෙන්නට හරිනු ලැබේ (සාමාන්‍යයෙන් මෙය කරනු ලබන්නේ වර්ෂා කාලයේ දිය.)

3. **කොම්පෝස්ට් අඩුක්කුවක් (Compost pile) සකස් කර ගැනීම**

(අ) ද්‍රව්‍යවලට කිසිවක් නොකර, යටත් පිරිසෙයින් පැය 24 කට තිබෙන්නට හැරීම (පැසවීමේ ක්‍රියාවලිය පටන් ගැනීම සඳහා)

(ආ) ද්‍රව්‍ය ගොඩවල් මුල්ලුවකින් පිරමින්, මීටර් 2.2 ක පළල, මීටර් 1.6 ක උස සහ ඝන මීටර 4 ක අවම ඝනත්වයෙන් යුත් ත්‍රිකෝණාකාර අඩුක්කුවක් සකස් කර ගැනීම.

(ඇ) මෙකී අඩුක්කුව සෙන්ටිමීටර 2 ක ඝනකමින් යුත් පස් තට්ටුවකින් හෝ පරණ කොම්පෝස්ට් තට්ටුවකින් වසා දැමීම.

*Coconut Bulletin වෙළුම 5 අංක 2 (1988 දෙසැම්බර්) සඟරාවෙන් උපුටා ගන්නා ලදි.

(ඇ) උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් $60^0$ දක්වා ඉහළ නගින්නට ඉඩ හැරීම (උෂ්ණත්වය මීට වඩා වැඩි නම් එය සෙන්ටිග්‍රේඩ් $60^0$ හි තබා ගැනීමට ජලය එක් කළ යුතුය)

(ඉ) දින 90 ක් ගත වූ විට කොම්පෝස්ට් පිළියෙළ වී හමාර නිසා වගාවන් සඳහා පෝර වශයෙන් ප්‍රයෝජනයට ගත හැකිය.

(ඊ) කොම්පෝස්ට් සකස් වූවායින් පසුව ද්‍රව්‍යවල විශාලම කැබලි මාපටැඟිල්ල හා දබරැඟිල්ල අතරෙහි පොඩි කළ හැකිය.

**කාර්මික ක්‍රමය**

(අ) වනාන්තරවලින් හා නාගරික ප්‍රදේශවලින් පීවී ශාක ද්‍රව්‍ය එකතු කර ට්‍රැක්ටර් මඟින් ප්‍රවාහනය කරනු ලැබේ.

(ආ) යන්ත්‍රානුසාරයෙන් ද්‍රව්‍ය කපා ගනු ලැබේ. (විශාලම කැබැල්ලේ අඩි විශ්කම්භය මිලිමීටර 8 කට අඩු විය යුතුය)

(ඇ) අවම වශයෙන් පැය 24 ක කාලයකට 'ඉසින යන්ත්‍ර' උපයෝගී කර ගනිමින් ජලය ඉසීම කරනු ලැබේ.

(ඇ) ද්‍රව්‍යවලට කිසිවක් නොකර අවම වශයෙන් සති දෙකකට තිබෙන්නට හැරිය යුතුය.

(ඉ) යන්ත්‍රානුසාරයෙන්, කුඩා ගොඩවල් ත්‍රිකෝණාකාර අවුක්කුවක් සකස් වන සේ ගොඩ ගසනු ලැබේ.

(ඊ) අවුක්කුවෙහි උස පළල යනාදිය, අතින් පිළියෙල කර ගන්නා අවුක්කුවෙහි ප්‍රමාණයන් මෙන් දෙගුණයකි.

(උ) උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් $70^0$ දක්වා ඉහළ නැගීමට ඉඩ හරිනු ලැබේ.

(ඌ) ද්‍රව්‍ය මාස 6 ක කාලයකට පැසවීම සඳහා තබා, ඉන් පසුව බෝග සඳහා ප්‍රයෝජනයට ගත යුතුය.

**කොළ අතු කොම්පෝස්ට්වල රසායනික සංයුතිය**

| | මාස 1 කට පසුව | මාස 3 කට පසුව |
|---|---|---|
| pH | 5.7 | 7.1 |
| මුළු N (%) | 0.43 | 0.97 |
| $P_2O_5$ (%) | 0.12 | 0.17 |
| KO (%) | 0.30 | 0.48 |

**කොළ අතු කොම්පෝස්ට් යෙදීම**

(අ) කෘෂිකාර්මික බෝග වෙනුවෙන් හෙක්ටයාරයකට/ටොන් 50 - 80

(ආ) අලෙවිය සඳහා වගාව වෙනුවෙන් හෙක්ටයාරයකට/ටොන් 100

(ඇ) කෘෂිකාර්මික පාංශු කර්මාන්ත ප්‍රදේශයක් ඇති කිරීම හෙක්ටයාරයකට/ටොන් 500

(ඇ) ගස් රෝපණය වෙනුවෙන් - ප්‍රමාණවත් අත්දැකීම් නැත. කෙසේ වුවද, පැල ඉන්දවන කාලයේ ගසකට කිලෝග්‍රෑම් 60

(ඉ) වියළි ප්‍රදේශයේ පස වසා දැමීම සඳහා - කොළරොඩු තට්ටුවක් වශයෙන් සෙන්ටිමීටර 10 ක් ඝනකමට

පොල් වගා කරන්නෙකු විසින්, සිය පොහොර අවශ්‍යතා සපුරා ගනු පිණිස, හීවැටවල්, බඩවැටි, පදුරු පැලැටි යනාදියෙන් ලබා ගන්නා පැලැටි සුන්බුන් උපයෝගී කර ගනිමින් සිය ඉඩමේම කොම්පෝස්ට් අවුක්කුවක් සකස් කර ගත හැකිය. කොම්පෝස්ට් මඟින් පොල් ගසට අවශ්‍ය ශාක පෝෂණීයතා සැපයීම හැරුණු විට පස පසාරා යාමේ පහසුව පොල් මුල්වලට ගෙන දෙමින් ඒ අනුව පුළුල්ව විහිදී යන මුල් රටාවක් නිර්මාණය වීමට ඉවහල් වන ආකාරයෙන් පාංශු ව්‍යුහය දියුණු කිරීම ද සිදු වේ. පාංශු ව්‍යුහය දියුණු වීමත් සමඟ පාංශු වාතනයද දියුණු වේ. මේ හැර, කොම්පෝස්ට් යෙදීමෙන් පාංශුවල තෙතමනය රඳ සිටීමේ ධාරිතාවය ද ඉහළ නැංවිය හැකිය.

කොම්පෝස්ට් යෙදීමේ ප්‍රතිඵල වශයෙන් ක්ෂුද්‍රජීවී හා බිම්පණු ජනගහනය වැඩිවීමෙන් ගසට පෝෂක සැපයුම වැඩි වන අතර පාංශු ව්‍යුහය දියුණු වනු ඇත. පාංශුවල තෙතමනය රඳ සිටීමේ හැකියාවද කොම්පෝස්ට් එක් කිරීමෙන් දියුණු කළ හැකිය. මේ සියලු සාධකවල අවසාන ප්‍රතිඵලය වන්නේ වඩා හොඳ පොල් පලදාවක් ගෙන දෙන සාරවත් පසක් නිර්මාණය වීමය.